# බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමා ආශ්‍රිතව හඳුනාගත හැකි මුද්‍රාවන්හි සමවිෂමතාවයන් පිළිබඳ අධ්‍යයනයක්

**කුමාරි අයි.ඒ.වී.පී.කේ,[1] කුමාරි බී.එස්.පී,[2] සෙව්වන්දි කේ. ඩී. සී. [3]**

සංස්කෘතිකාංගයක් වන ප්‍රතිමාවන් හඳුන්වනු ලබන්නේ සැබෑ ලෝකය තුළ දැක ඇති හෝ සංකල්පනාත්මක ලෝකය තුළ මිනිසුන් ගොඩනගාගත් කල්පිත රූපකායක අනුරුවකි. මෙම ප්‍රතිමා සංකල්පය ශිෂ්ටාචාරික අවධියේ ප්‍රාග් ආගමික සංකල්පය හා බැඳී පවතින්නක් වූවකි. ලංකාව තුළ මුල් කාලීනව පැවති ප්‍රතිමා සංකල්පයන් පිළිබඳ නිශ්චිත හඳුනාගැනීමක් නොමැති වූවත්, බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා හා බෝධිසත්ව ප්‍රතිමා පිළිබඳ සාධක සුලභව හඳුනාගත හැකිය. බුද්ධ ප්‍රතිමා හා හින්දු දේව ප්‍රතිමා ආශ්‍රිතව හඳුනාගත හැකි මූලික අංග අතර අභින සහ මුද්‍රා සඳහා සුවිශේෂී බවක් හිමි වේ. මුද්‍රා යනු සංකේතාත්මක ප්‍රතිමාවක එන භාව ප්‍රකාශනය සඳහා අතක් ආශ්‍රිතව සන්නිවේදනය කරනු ලබන්නා වූ ක්‍රමවේදයයි. මෙම අධ්‍යනයේදී බුද්ධ ප්‍රතිමා හා දේව ප්‍රතිමා ආශ්‍රිතව හඳුනාගත හැකි මුද්‍රාවන්හි සමවිෂමතාවයන් පිළිබඳ අධ්‍යයනයට ලක්කරනු ඇත. උක්ත අධ්‍යයනයේ ප්‍රධාන වශයෙන් හින්දු දේව ප්‍රතිමාවල හා බුද්ධ ප්‍රතිමා ආශ්‍රිතව හඳුනාගත හැකි මුද්‍රා හඳුනාගැනීමත්, ඒවායෙහි එකිනෙකට හඳුනාගත හැකි සමවිෂමතා අධ්‍යයනය කිරීමත් අරමුණු ලෙස ක්‍රියාත්මක වේ. මෙම අධ්‍යයනයට අදාළ දත්ත රැස්කර ගැනීම වෙනුවෙන් ප්‍රාථමික ක්‍රමවේදය යටතේ කෞතුකාගාර අධ්‍යනයේ හා සහභාගීත්ව නිරීක්ෂණ සිදු කරන ලදී. එමෙන්ම ද්විතියික ක්‍රමවේද වශයෙන් පුස්තකාල අධ්‍යනයේ නියෙලෙන ලදී. බුද්ධ ප්‍රතිමා හා හින්දු දේව ප්‍රතිමා අධ්‍යයනයේදී වරද මුද්‍රාව, විතර්ක මුද්‍රාව, අභය මුද්‍රාව, කටක හස්ත මුද්‍රාව යන මුද්‍රාවන් ප්‍රතිමා දෙවර්ගයේදී ම හඳුනාගත හැකිය. ධ්‍යාන මුද්‍රාව, භූමිස්පර්ෂ මුද්‍රාව, පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව, ධම්මචක්ක මුද්‍රාව යන මුද්‍රා බුද්ධ ප්‍රතිමා ආශ්‍රිතව පමණක් හඳුනාගත හැකි මුද්‍රා ලෙස පෙන්වා දිය හැකිය. ගජ හස්ත මුද්‍රාව, නමස්කාර මුද්‍රාව හෙවත් අංජලී මුද්‍රාව යන මුද්‍රාවන් හඳුනාගත හැක්කේ හින්දු දේව ප්‍රතිමා ආශ්‍රිතව පමණකි. මෙම මුද්‍රාවන්ගෙන් ප්‍රකාශිත භාවමය සංඥාවන් ප්‍රතිමා විශේෂ ද්විත්වයේ දී වෙනස් වන බවක් හඳුනාගත නොහැකිය. ඒ ඒ ආගමානුකූලව අදාළ මුද්‍රාවන් නිරූපණය කර ඇති බවක් මෙහිදී හඳුනාගත හැකි විය.

**ප්‍රමුඛ පද :** සංස්කෘතික අංග, බුද්ධ ප්‍රතිමා, හින්දු දේව ප්‍රතිමා, මුද්‍රා, සමවිෂමතා

[1,2,3] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sachiprabha1997330@gmail.com